# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 877 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/05/2024 පැය 1615

**මාධ්‍ය නිවේදනය**

**දික්වැල්ල වැවුරුකන්නල රජමහා විහාරස්ථානයේ හා දීසවාළුකාරාම විහාරස්ථානයේ රන්දෝලි පෙරහර වීදී සංචාරය - රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව.**

දික්වැල්ල පොලිස් වසමේ ඓතිහාසික සිද්ධස්ථානයන් වන වැවුරුකන්නල රජමහා විහාරස්ථානය මඟින් 184 වන වරට පවත්වනු ලබන රන්දෝලි පෙරහර සහ දීසවාළුකාරාම විහාරස්ථානය මඟින් 186 වන වරටත් පවත්වනු ලබන රන්දෝලි පෙරහර 2024.05.24 වන දින සහ 2024.05.25 දින වීදී සංචාරය කිරීමට නියමිතව ඇත.

2024.05.24 වන දින දීසවාළුකාරාම රජමහා විහාරයේ රන්දෝලි පෙරහර එදින දහවල් 01.00 ට දීසවාළුකාරාම විහාරස්ථානයෙන් ආරම්භ වී යහල හන්දිය ඔස්සේ නුගගහ හන්දියෙන් ප්‍රධාන මාර්ගයට පිවිස ප්‍රධාන මාර්ගය ඔස්සේ දික්වැල්ල දෙසට ගමන් කර පරණ බෙලිඅත්ත පාරට හැරී රත්මලේ මාර්ගයෙන් නැවත ලෝන් බීච් හන්දියට පැමිණ අළුත් පාර ඔස්සේ කප්පුගස් කොරටුව මාර්ගයෙන් නැවත විහාරස්ථානය දක්වා ගමන් කිරීමට නියමිතව ඇත.

මෙදිනම වැවුරුකන්නල බුදු රජමහා විහාරස්ථානයෙන් රන්දෝලි පෙරහර දහවල් 01.00 ආරම්භ වී වැලිහිටිය අතුරු මාර්ගයෙන් ගමන් කර අළුත්ගොඩ හන්දියෙන් ප්‍රධාන මාර්ගයට පිවිස ප්‍රධාන මාර්ගය ඔස්සේ ගමන් කර නැවත සනත් ජයසූරිය ගම්මානයේ පාරෙන් ගමන් කර දෙමටපිටිය හන්දියෙන් දික්වැල්ල බෙලිඅත්ත ප්‍රධාන මාර්ගයට පිවිස එම මාර්ගයේ වලස්ගල නගරය හරහා නැවත විහාරස්ථානය දක්වා ගමන් කිරීමට නියමිතව ඇත.

2024.05.24 වන දින දික්වැල්ල පොලිස් වසමේ කොළඹ කතරගම ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නා රථවාහන සඳහා අවහිරයකින් තොරව ගමන් කිරීම සඳහා රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කර ඇත. මඟී ප්‍රවාහන බස් රථ හා බරවාහන පමණක් දික්වැල්ල කතරගම ප්‍රධාන මාර්ගයේ ගමන් කිරීමට ඉඩ සලසා ඇති අතර යතුරුපැදි, වෑන් හා කාර් රථ ඇතුළු සැහැල්ලු වාහන ගමන් කිරීම සඳහා විකල්ප මාර්ගයක් ලෙස කතුරුමුරුංගා ගස් හන්දියේ අතුරු මාර්ගයෙන් දඹගස්ආර මාර්ගයට හරවා වලස්ගල මාර්ගය ඔස්සේ රදම්පල නගරයට ගමන් කර කිරිනැලිය වේහැල්ල මාර්ගයෙන් රත්මලේ නගරයට පිවිස රත්මලේ නගරයෙන් වමට හරවා හුන්නදෙනිය හන්දියට පිවිස ප්‍රධාන මාර්ගය ඔස්සේ මාතර දෙසට ගමන් කල හැකිය. මෙම

මාර්ගය රියදුරන්ට දර්ශනය වන අකාරයට සංඥා පුවරු හා මාර්ගය හඳුනා ගැනීමට හැකි වන ආකාරයට පුවරු සවිකර මාර්ගය නිවැරදිව පෙන්වා දී ඇත.

වැවුරුකන්නල බුදු රජමහා විහාරයේ **රන්දෝලි මහා පෙරහර** 2024.05.25 වන දින දහවල් 01.00 ට විහාරස්ථානයෙන් ගමන් ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙම මහා පෙරහර වැවුරුකන්නල රජමහා විහාරයේ ප්‍රධාන දොරටුවෙන් ගමන් ආරම්භ කර අළුත් පාර ඔස්සේ ලෝන් බීච් හන්දිය දක්වා ගමන් කර ලෝන් බීච් හන්දියෙන් වමට ඇති අතුරු මාර්ගයෙන් තෙල් කඩේ හන්දියට පිවිස පරන බෙලිඅත්ත පාරේ මීටර් 500 ක් පමණ ගමන් කර කතරගම කොළඹ ප්‍රධාන මාර්ගයෙන් දික්වැල්ල නගරයට පිවිසීමට නියමිතය. ඉන් පසු දික්වැල්ල නගරය ඔස්සේ අළුත් පාර හන්දියට පැමිණ අළුත් බෙලිඅත්ත මාර්යේ නැවත විහාරස්ථානය දක්වා ගමන් කිරීමට නියමිතය.

මෙම මහ පෙරහර වීදි සංචාරය කරන අවස්ථාවේදී ප්‍රධාන මාර්ගයේ බස් රථ ඇතුළු බර වාහන ගමන් කිරීමට ඉඩ සලසා ඇති අතර සැහැල්ලු වාහන ගමන් කිරීම සඳහා විකල්ප මාර්ගයක් ලෙස කතුරුමුරුංගා ගස් හන්දියේ අතුරු මාර්ගයෙන් දඹගස්ආර මාර්ගයට හරවා රදම්පල නගරයට පිවිස කිරිනැලිය වේහැල්ල මාර්ගයෙන් රත්මලේ නගරයට පැමිණ රත්මලේ නගරයෙන් වමට හරවා හුන්නදෙනිය හන්දියට පැමිණ ප්‍රධාන මාර්ගය ඔස්සේ මාතර දෙසට ගමන් කල හැකිය.

ඒ අනුව පෙරහර පැවැත්වෙන කාල සීමාව තුල නියමිත ප්‍රදේශයේ රථවාහන ගමනාගමනය සීමා කරන අතර එම කාලය තුළ දික්වැල්ල නගරය හරහා ගමන් කිරීමට අපේක්ෂිත මහජනයා ඉහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**